# සාමාන්‍ය සමයේ විසිඑක්වන සතිය
# සිකුරාදා

## පළමුවන කියැවීම

ශුද්ධවූ පාවුලු තුමන් විසින් තෙසලෝනිකවරුන්ට ලියන ලද පළමුවන හසුනෙන් කොටසකි.

1 තෙසලෝනික 4 : 1-8

"දෙවියන් වහන්සේගේ කැමැත්ත නම් ඔබ ශුද්ධව සිටීම ය."

සහෝදරවරුනි, දෙවියන් වහන්සේ ප්‍රසන්න කිරීමට කෙසේ හැසිරිය යුතු දැ යි ඔබ අපෙන් ඉගෙන ගත්තහු ය. ඔබ එසේ කරන ලෙස, අපි සහකාර කිතුණුවන් වශයෙන් ඔබගෙන් ඉල්ලා අවවාද කරමු. ජේසුස් ස්වාමින් වහන්සේගේ නාමයෙන් අපි ඔබට කුමන අවවාද අනුශාසනා දුනිමු දැයි ඔබ දන්නහු ය. දෙවියන් වහන්සේගේ කැමැත්ත නම් ඔබ ශුද්ධ ව සිටීම ය. ඔබ කාමයෙහි වරදවා හැසිරීමෙන් වැළකී සිටිය යුතුය. ඔබ එකිනෙකා තම තමාගේ ශරීරය දමනය කරගෙන එය ශුද්ධ ව ද, ගෞරවයෙන් යුක්තව ද තබා ගැනීමට දැනගත යුතුය.

දෙවියන් වහන්සේ නොදන්නා විජාතීන් මෙන්, ඔබ කාම තෘෂ්ණාවෙහි ගැලී නොසිටිය යුතු ය. මේ කාරණයේ දී කිසිවකු තම සහෝදරයා රවටා, වාසියක් නොගත යුතුය. මන්ද, ඔබ අපට කලින් කියා තිදින් අවවාද කළ ලෙස, මෙබඳු අයට ස්වාමින් වහන්සේ විපාක දෙන සේක. දෙවියන් වහන්සේ අප කැඳෙව්වේ අපවිත්‍රකමට නොව පවිත්‍රකමට ය. එබැවින් මේ ඉගැන්වීම ප්‍රතික්ෂේප කරන්නා විසින් ප්‍රතික්ෂේප කරනු ලබන්නේ මනුෂ්‍යයා නොව, ස්වකීය ශුද්ධාත්මයාණන් ඔබට ප්‍රදානය කරන දෙවියන් වහන්සේ ය.

දේව වාක්‍යය එසේය.

# පිළිතුරු ගීය

ගීතාවලිය 97: 1-2, 5-6, 10-12

පිළිතුර: සමිඳුන් තුළ ප්‍රීති ප්‍රමෝද වෙමු.

ගීය:

සමිඳාණෝ රජකම් කරන සේක. මිහිතලය ප්‍රීති වේවා!
දිවයින් සියල්ල ප්‍රීති ප්‍රමෝද වේවා!
වලාකුළු සහ අඳුර එතුමන් වටකර සිටින්නේ ය. දැහැමිකම සහ යුක්තිය එතුමන්ගේ සිහසුනේ පදනම් ය.

කඳු හෙල් සමිඳාණන් දැක ඉටි මෙන් උණු වන්නේය. මුළු මිහිතලය ද සමිඳුන් දැක එසේ වන්නේය.
දෙව්ලොව එතුමන්ගේ සාධාරණකම ප්‍රකාශ කරන්නේය. සකල ජනතාවෝ එතුමන්ගේ මහිමය නරඹන්නෝ ය.

සමිඳුනි, ඔබ නපුරට වෛර කරන්නන්ට ප්‍රේම කරන සේක. ඔබට ගැති වූවන්ගේ ජීවිත ඔබ ආරක්ෂා කරන සේක. දුෂ්ටයාගේ බලයෙන් ඔබ ඔවුන් මුදාලන සේක.

දැහැමියන් මත එළිය බබළයි. යහපත් අය මත සතුට දිළිසෙයි.
පින්වත්නි, සමිඳුන් තුළ ප්‍රීති ප්‍රමෝද වෙන්වා!
එතුමන්ගේ සුවිශුද්ධ නාමය සිහකොට, එතුමන්ට ප්‍රශංසා කරන්වා!

## සාධුකාරය (දෙවසරේම)

ආලේලූයා! ආලේලූයා!
මනුෂ්‍ය පුත්‍රයාණන් ඉදිරියෙහි පෙනී සිටින පිණිස අයැදිමින් හැම වේලේම අවදිව සිටින්න.

ආලේලූයා!

නොහොත්

ආලේලූයා! ආලේලූයා!
අපි සමිඳුන්ගේ උපකාරය උදක්ම බලා සිටිමු.
එතුමන්ගේ වචනය කෙරෙහි බලාපොරොත්තුව තබමු.

ආලේලූයා!

## සුවිශේෂය

සුවිශේෂක මතෙව් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

මතෙව් 25: 1–13

"අන්න මනාලයා, ඔහු පෙරමගට යන්න."

"ස්වර්ග රාජ්‍යය මෙසේ උපමා කළ හැකිය. තෙල් පහන් රැගෙන මනාලයා පෙරමගට යුවතියෝ දස දෙනෙක් ගියෝය. ඔවුන් අතරෙන් පස් දෙනෙක් නුවණ නැති අය ය. පස් දෙනෙක් නුවණ ඇති අය ය. නුවණ නැති අය සිය පහන් ගෙන යද්දී ඒ සමග තෙල් ගෙන ගියේ නැත. එහෙත් නුවණ ඇති අය සිය පහන් ගෙන යද්දී ඒ සමග බඳුන්හි තෙල් ගෙන ගියහ. මනාලයාගේ පැමිණීම පමා වූ කල ඒ සියල්ලෝම නිදිබර වී නිදා ගත්හ."

"මධ්‍යම රාත්‍රියේ 'අන්න මනාලයා! ඔහු පෙරමගට යන්නැ'යි හඬක් විය. එවිට ඒ සියලු යුවතියෝ නැගිට සිය පහන්වල තිර සකස් කළහ. එකල නුවණ නැති අය, 'අපේ පහන් නිවී ගෙන යයි, ඔබේ තෙල්වලින් ටිකක් අපට දෙන්නැ'යි නුවණ ඇති අයට කීහ. එහෙත් නුවණ ඇති අය, 'එසේ කළ නොහැක. අප දෙගොල්ලන්ටම සෑහෙන තරම් තෙල් මෙහි නැත. එබැවින් වෙළඳහලට ගොස් ඔබ ම මිලදී තෙල් ගන්නැ'යි පිළිතුරු දුන්හ. ඔවුන් ගිය පසු මනාලයා ආවේය. සූදානම් වී සිටි පස් දෙනා ඔහු හා සමග මංගලෝත්සවයට ගියහ. ඔවුන් ඇතුල් වූ විට දොර වසන ලදි."

"පසුව අනිත් යුවතියෝ අවුත්, ස්වාමිනි, ස්වාමිනි, අපට දොර හැරිය මැනවැ"යි කීය. එහෙත් මනාලයා 'මම ඔබ කිසිසේත් නොහඳුනම්'යි පිළිතුරු දුන්නේ ය. එබැවින් දවසවත්, පැයවත්, ඔබ නොදන්නා නිසා අවදිව ඉන්නැ"යි ජේසුස් වහන්සේ වදාළ සේක.

සුවිශේෂ වාක්‍යය එසේය.